රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2012 (III)

මගේ අංක : CS/DOS/02/05/01

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2017.08.14

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2012.05.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012, 2012.06.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 (I) හා 2016.04.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 (II) කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ එම සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මීට පෙර අවස්ථාව ලබා දුන් අවසාන දිනය වන 2016.05.31 දින දක්වා ඒ සඳහා මනාපය ප්‍රකාශ කිරීමට නොහැකි වූ එහෙත් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2011.08.01 වන විට මධ්‍යම රජයේ සේවයේ නිරතව සිටි MN 4-2006 (ඒ) වැටුප් පරිමාණයේ වැටුප් ලබන ලද උපාධිධාරී නිලධාරීන්ට එම සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කිරීමට මෙයින් නැවත අවස්ථාව ලබා දෙනු ලැබේ.

03. තවද MN 4-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන උපාධිධාරී තනතුරක 2011.08.01 දිනට පලාත් රාජ්‍ය සේවයේ නිරතව සිටි හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2010 (1) අනුව මධ්‍යම රජයේ සංවර්ධන නිලධාරී සේවයට ස්ථානමාරු වී පැමිණ සේවයේ නිරතව සිටින නිලධාරීන්ටද මෙම චක්‍රලේඛය යටතේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

04. ඉහත 02 හා 03 ඡේද යටතේ අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කළ හැකි අවසාන දිනය **2017.09.30** වේ.

05. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ දැනටමත් මනාපය පළ කර ඇති හා මනාපය පළ කරන නිලධාරීන්ට එම ඉල්ලීම් නැවත ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව නොමැති අතර එම සියලුම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**ජේ.ජේ.රත්නසිරි**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**